International Trade Centre

European Union

UNIDO

යුරෝපාසංගමය සහ ශ්‍රී ලංකාව අතර වෙළඳාම සඳහා අනුග්‍රහය

# කලාපීය සහ යුරෝපා සංගමයේ වෙළඳපොළ තුල, සුළු හා මධ්‍යම ප්‍රමාණයේ වෙළඳ තරඟකාරිත්වය නැංවීම







photos ©shutterstock.com



## ව්‍යාපෘති සාරාංශය

යුරෝපා සංගමය සහ ශ්‍රී ලංකාව අතර වෙළඳාම පිළිබඳ අනුග්‍රහය දක්වීමේ ව්‍යාපෘතියේ අරමුණ වන්නේ කලාපීය සහ යුරෝපා සංගමයේ වෙළඳපොළ තුල සුළු හා මධ්‍යම ප්‍රමාණයේ ව්‍යාපාරවල වෙළඳ තරඟකාරිත්වය ඉහල නැංවීමය.

වසර 4ක් පුරා ක්‍රියාත්මක වන, යුරෝපා සංගමය විසින් යුරෝ මිලියන 8ක මූල්‍යාධාරයක් සපයන මෙම ව්‍යාපෘතිය, මූලමනින්ම වෙළඳාම ප්‍රමුඛ කරගත් වර්ධනය සහ කලාපීය ඒකාබද්ධතාවය සඳහා දයක වේ. එය සුළු හා මධ්‍යම ප්‍රමාණයේ ව්‍යාපාරයන්ගේ අපනයන තරඟකාරිත්වය සඳහා සහ ආර්ථික වර්ධනයේ සහ සංවර්ධනයේ ඉහල හැකියාවක් ඇති අංශයන්ගේ නිෂ්පාදන වටිනාකම වැඩිකිරීම සඳහා සහයෝගය ලබා දෙයි.

යුරෝපා සංගමයේ ජීඑස්පී ප්ලස් (GSP+) සහනය ලබාදීමේ ප්‍රතිඵලයක් ලෙස සුළු හා මධ්‍යම ප්‍රමාණයේ ව්‍යාපාරයන්ට උදවී ඇති මහඟු අවස්ථාවෙන් වාසි ලබාගැනීම සඳහා ලෝක වෙළඳ සංවිධානයේ ප්‍රතිපත්ති සහ ව්‍යවස්ථාපිත ප්‍රතිසංවිධානයන් හා ඒකාබද්ධ වීම සඳහා ව්‍යාපෘතිය තුලින් ශ්‍රී ලංකාවට සහාය ලබාදෙනු ඇත. කලාපීය සහයෝගීතාවය පිළිබඳ දකුණු ආසියානු සංගමය (සාක් සංගමය) අතර ඉහල කලාපීය ඒකාබද්ධතාවයක් සඳහාද මෙයින් ඉඩ සැලසේ.

විශේෂයෙන්ම සුළු හා මධ්‍යම ප්‍රමාණයේ ව්‍යාපාරයන් සඳහා වෙළඳපොළ ප්‍රවේශයට ඇති ප්‍රධාන බාධාවන් වන අන්තර් දේශසීමා ක්‍රියාමාර්ගයන් වලදී ප්‍රමිතීන්ට සහ කාර්යක්ෂමතාවයන්ට අනුකූලතාවය දක්වීම පිළිබඳවද ව්‍යාපෘතිය මගින් සලකා බලනු ඇත. කුළුබඩු, ආහාර සහ තොරතුරු තාක්ෂණය/ ව්‍යාපාර ක්‍රියාකාරකම් බැහැර දීමේ කර්මාන්තය (IT/BPO) යන ක්ෂේත්‍රයන්ගේ වටිනාකම් දමයන් ව්‍යාප්ත කිරීම කෙරෙහි විශේෂ අවධානය යොමුකර ඇත.

ව්‍යාපෘතිය මගින් පුහුණුව සහ නිපුණතා සංවර්ධනය කෙරෙහි විශේෂ අවධානයකින් යුතුව වෙළඳ හැකියා වර්ධනය සහ තාක්ෂණික සහයෝගය ලබා දෙනු ඇත.

කාන්තාවන් විශාල වශයෙන් වෙළඳාමෙහි යෙදී සිටින නිසා සුළු හා මධ්‍යම ප්‍රමාණයේ ව්‍යාපාරයන්ගේ සහ අපනයන කරුවන්ගේ හැකියා වර්ධනය පිළිබඳව සැලකීමේදී කාන්තාවන් කෙරෙහි විශේෂ අවධානයක් යොමුවනු ඇත.

## සන්දර්භය

ආසියා පැසිෆික් කලාපයේ සීඝ්‍රයෙන් වර්ධනය වන ආර්ථිකයක් ලෙස ශ්‍රී ලංකාවට ඉතා ඉහල අපනයන හැකියාවක් ඇත.

කලාපයේ ව්‍යාපාරික කේන්ද්‍රස්ථානය වශයෙන් ශ්‍රී ලංකාව ක්‍රමයෙන් නැගී සිටී. ශ්‍රී ලංකාව, ඈත පෙරදිග සහ පැසිෆික් කලාපයේ රටවල් යුරෝපය හා ඇමෙරිකාව සමඟ සම්බන්ධ කරන මුහුදු මාර්ග මංසන්ධියේ, සීඝ්‍රයෙන් වර්ධනය වන ඉන්දියා අර්ධ-මහාද්වීපයට යාබදව සහ ගිනිකොනදිග ආසියාවට සහ මැදපෙරදිගට ආසන්නයෙන් පිහිටි රටක් ලෙස සාක් කලාපය තුල වැදගත් උපායමාර්ගික ස්ථානයක පිහිටා ඇත.

දුගීබව අඩුවන බවට සහ ඒක පුද්ගල ආදයම වැඩි වන බවට පෙන්වන විවිධ දර්ශකයන් හමුවේ, සිය වර්ධනය සාර්ව වර්ධනයක් ලෙස තහවුරු කර ගැනීමේ අභියෝගයට ශ්‍රී ලංකාව මුහුණ දී සිටී. දුගී බව ග්‍රාමීය ප්‍රදේශ වල සැබෑ ලෙසම ඉහල මට්ටමක පවතින අතර දුගී බවින් පිරුණු කුඩා ප්‍රදේශ දක්නට ඇත. 2014 වසරේදී තරුණ (15-24 වයස් කාණ්ඩයේ) විරැකියාව 19%ක් වූ අතර රටේ ශ්‍රම බලකායෙන් 35%ක් කාන්තාවන් වූහ.

විවිධ ව්‍යාපාරික අංශයන් තුල ශ්‍රී ලංකාවේ ව්‍යාපාරයන් ගෙන් 80% වැඩි ප්‍රමාණයක් සුළු හා මධ්‍යම ප්‍රමාණයේ ව්‍යාපාරයන් වන අතර සමස්ථ රැකියාවන් ගෙන් 35%ක් ඒවායින් සැපයේ. ඒ අනුව රැකියා සැපයීමේ ඉහල හැකියාවක් ඇති සුළු හා මධ්‍යම ප්‍රමාණයේ ව්‍යාපාරයන්ගේ නිෂ්පාදන සහ අපනයනයන් සඳහා අනුග්‍රහය දක්වීම රටේ සාර්ව වර්ධන දයකත්වය සඳහා අතිශයින් වැදගත් වන්නේය.

ශ්‍රී ලංකා රජය අපනයන වර්ධනය සහ පුද්ගලික අංශයේ සංවර්ධනය සිය සංවර්ධන න්‍යාය පත්‍රයේ ඉහලින්ම තබා ඇත. ව්‍යාපෘතිය රටේ වෙළඳ ප්‍රමුඛතාවයන් සඳහා අනුග්‍රහය දක්වනු ඇත.

**පොදු අරමුණ:**
ශ්‍රී ලංකවේ වෙළඳාම මූලිකවූ සාර්ව වර්ධනයට සහ කලාපීය ඒකාබද්ධතාවයට දයකත්වය දක්වීම සහ එමගින් දුගීබව තුරන්කිරීමට දයක වීම

**විශේෂිත අරමුණ:**
කලාපීය සහ යුරෝපා සංගමයේ වෙළඳපොළ තුල ශ්‍රී ලාංකික සුළු හා මධ්‍යම ප්‍රමාණයේ ව්‍යාපාරයන්ගේ වෙළඳ තරඟකාරිත්වය ඉහල නැංවීම

**අපේක්ෂිත ප්‍රතිඵල:**

- ER 1. ලෝක වෙළඳ සංවිධානය, කලාපීය ඒකාබද්ධ ක්‍රියාවලිය සහ යුරෝපීය සංගමයේ ජීඑස්පී ප්ලස් (GSP+) යෝජනාක්‍රමය මත පදනම්වූ ප්‍රතිපත්ති, ව්‍යවස්ථාපිත ප්‍රතිසංස්කරණයන් සහ වෙළඳ සාකච්ඡා ඇතුලත් අපනයන තරඟකාරිත්වය සඳහා ගැළපෙන වෙළඳ උපායමාර්ගයන් සැලසුම්කර ක්‍රියාත්මක කිරීම.
- ER 2. සාක් කලාපයේ සහ යුරෝපා සංගමයේ රටවලට අපනයනය කිරීමේදී අන්තර් දේශසීමා ක්‍රියාමාර්ගයන්ගේ කාර්යක්ෂමතාවය වැඩිකිරීම සහ හරස්-දේශසීමා ක්‍රියාමාර්ගයන්ට අනුකූලතාවය දක්වීම සඳහා සුළු හා මධ්‍යම ප්‍රමාණයේ ව්‍යාපාරයන්ගේ හැකියාව වැඩි දියුණු කිරීම
- ER 3. කලාපීය සහ යුරෝපා සංගමයේ වෙළඳ පොළ ප්‍රමිතීන් සහ අවශ්‍යතාවයන් සපුරා ගැනීම සඳහා වැඩිදියුණු කළ අනුකූලතා සහ ප්‍රමිති යටිතල ව්‍යුහ සේවා
- ER 4. අපනයන පදනම් වූ අංශවල සුළු හා මධ්‍යම ප්‍රමාණයේ ව්‍යාපාරයන්ගේ තරඟකාරිතවය වැඩි කිරීම (කුළුබඩු, ආහාර සහ තොරතුරු තාක්ෂණය/ ව්‍යාපාර ක්‍රියාකාරකම් බැහැර දීමේ-IT/BPO කර්මාන්තය).

# අපේක්ෂිත ප්‍රතිඵල

**අපේක්ෂිත ප්‍රතිඵලය 1:** ලෝක වෙළඳ සංවිධානය, කලාපීය ඒකාබද්ධ ක්‍රියාවලිය සහ යුරෝපීය සංගමයේ ජීඑස්පී ප්ලස් යෝජනාක්‍රමය මත පදනම්වූ ප්‍රතිපත්ති, ව්‍යවස්ථාපිත ප්‍රතිසංස්කරණයන් සහ වෙළඳ සාකච්ඡා ඇතුලත් අපනයන තරගකාරිත්වය සඳහා ගැළපෙන වෙළඳ උපායමාර්ගයන් සැලසුම්කර ක්‍රියාත්මක කිරීම.

සමාගම් වලට ගෝලීය සහ කලාපීය වෙළඳපොළ වලට ප්‍රවේශවීමේ අවකාශ සලසමින් කලාපීය සහ ද්විපාර්ශවීය නිදහස් වෙළඳ ගිවිසුම් වලට ඇතුලත් වෙමින් සහ එවැනි ගිවිසුම් සඳහා සාකච්ඡා පවත්වමින් ශ්‍රී ලංකාව සිය ආර්ථිකය විවෘත කර ඇත. ශ්‍රී ලංකාව සිය ආරථිකය නිදහස් කිරීම නිසා, නිදහස් වෙළඳ ගිවිසුම් වල ඇතුලත්විය හැකි වෙළඳ කොන්දේසි වලට අනුකූලතාවය දක්වන ප්‍රතිපත්ති සහ ව්‍යවස්ථාමය රාමුවක් සහිත වෙළඳ තරගකාරිත්වය සඳහා ජාතික අපනයන උපායමාර්ගයක් සකස්කිරීම සංකීර්ණ ක්‍රියාවලියක් වී ඇත. ශ්‍රී ලංකාවේ ආර්ථිකය විවෘතවීමත් සමගම අපනයනය කරන සුළු හා මධ්‍යම ප්‍රමාණයේ ව්‍යාපාරයන් බහුපාර්ශවීය, කලාපීය සහ දේශීය සංකීර්ණ වෙළඳපොල පරිසරය වටහාගැනීමට අවශ්‍ය තොරතුරු නොමැතිවීම නිසා දුෂ්කරතාවයන්ට මුහුණු දී ඇත. එමනිසා ඔවුන්ට නව වෙළඳපොළ අවස්ථාවන්ගෙන් පූර්ණ ප්‍රතිලාභ ලබා ගැනීමට සහ වෙළඳ පොළ අවශ්‍යතාවයන්ට අනුකූලතාවය දැක්වීමට නොහැකි වී ඇත.

ව්‍යාපෘතිය මගින්:

- දිවයිනේ සුළු හා මධ්‍යම ප්‍රමාණයේ ව්‍යාපාරයන්ගේ ප්‍රයෝජනය සඳහා ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය සහ පුද්ගලික අංශයේ පුරෝගාමීත්වයෙන් ජාතික අපනයන ක්‍රමෝපායක් සැලසුම්කිරීම සහ ක්‍රියාත්මක කිරීමට උපදේශන සහාය ලබාදීම,
- වෙළඳ සාකච්ඡා සංවිධානය කර ක්‍රියාත්මක කිරිම සඳහා ඇති ජාතික හැකියාවන් සවිමත්කිරීම,
- වෙළඳ විසඳුම් ඒකකයක් පිහිටුවීම,
- වෙළඳ ප්‍රතිපත්තියක් සකස්කිරීමේදී සහ ක්‍රියාත්මක කිරීමේදී ව්‍යාපාරික උපදේශනයන් සැපයීම සඳහා පුද්ගලික අංශයට සහාය ලබා දීම, සහ
- වෙළඳ ප්‍රතිපත්තිමය, ව්‍යවස්ථාමය සහ සාකච්ඡාමය ගැටළු වලදී රාජ්‍ය-පුද්ගලික අංශයන්ගේ ප්‍රතිපත්තිමය සංවාදයන් ඇතිකිරීමට සහාය ලබා දීම, සිදු කරනු ලැබේ.

**අපේක්ෂිත ප්‍රතිඵලය 2**: සාක් කලාපයේ සහ යුරෝපා සංගමයේ රටවලට අපනයනය කිරීමේදී අන්තර් දේශසීමා ක්‍රියාමාර්ගයන්ගේ කාර්යක්ෂමතාවය වැඩිකිරීම සහ අන්තර් දේශසීමා ක්‍රියාමාර්ගයන්ට අනුකූලතාවය දැක්වීම සඳහා සුළු හා මධ්‍යම ප්‍රමාණයේ ව්‍යාපාරයන්ගේ හැකියාව වැඩි දියුණු කිරීම

ශ්‍රී ලංකාවේ ව්‍යාපාරික පරිසරය වැඩිදියුණු වී තිබෙන නමුත් ආනයනයන් සිදුකරන සුළු හා මධ්‍යම ප්‍රමාණයේ ව්‍යාපාරයන් කලාපීය සහ ජාත්‍යන්තර වෙළඳපොල වලදී සිය තරගකාරිත්වය සීමාකරන අභියෝග ගණනාවකට මුහුණ දී සිටී. රටේ ව්‍යාපාරික පරිසරය වැඩිදියුණු කිරීම සඳහා සහ කලාපීය (සාක් රටවල) සහ ජාත්‍යන්තර (යුරෝපා සංගමයේ) වෙළඳපොල වලදී ශ්‍රී ලාංකික සුළු හා මධ්‍යම ප්‍රමාණයේ ව්‍යාපාරයන්ගේ වෙළඳ තරගකාරිත්වය වැඩි කිරීම සඳහා දේශසීමා මෙහෙයුම් පහසුකම් සැපයීම ඉතා වැදගත්ය.

ව්‍යාපෘතිය මගින්:

- සුළු හා මධ්‍ය පරිමාන ව්‍යවසායකයින්ගේ පලදායී සහභාගීත්වය දිරිගන්වනු සඳහා ජාතික වෙළඳ පහසුකම් සැලසීමේ කමිටුව සවිගන්වන අතර, ශ්‍රී ලංකාව විසින් 2016 මැයි මාසයේදී පිලිගන්නා ලද ලෝක වෙළඳ සංවිධනයේ වෙළඳාම පහසු කරවීමේ ගිවිසුම ක්‍රියාත්මක කිරීම සඳහා සහාය ලබාදෙනු ලැබේ.
- විනිවිදභාවය වැඩිකරලීම සඳහා සහ ජාත්‍යන්තර වෙළඳ ගනුදෙනු පිළිබඳ තොරතුරු ලබාගැනීම පහසු කරවීම සඳහා, සුළු හා මධ්‍යම ප්‍රමාණයේ ව්‍යාපාරයන් සඳහා ජාතික වෙළඳ තොරතුරු මාවතක් නිර්මාණය කරනු ලැබේ,
- භාණ්ඩ නිශ්කාෂණ කටයුතු එකම ස්ථානයකින් සිදුකිරීම ක්‍රියාත්මක කිරීම සඳහා උපදේශන සේවා සපයනු ලැබේ, සහ
- අන්තර් දේශසීමා ක්‍රියාමාර්ගයන් කළමණාකරනය කිරීම සඳහා සහ යුරේපා සංගමයේ සහ සාක් රටවල වෙළඳපොළ අවශ්‍යතාවයන්ට අනුකූලතාවය දැක්වීම සඳහා සුළු හා මධ්‍යම ප්‍රමාණයේ ව්‍යාපාරිකයින්ට හැකියා වර්ධන පුහුණු ලබාදෙනු ඇත.

**අපේක්ෂිත ප්‍රතිඵලය 3:** කලාපීය සහ යුරෝපා සංගමයේ වෙළඳ පොළ ප්‍රමිතීන් සහ අවශ්‍යතාවයන් සපුරා ගැනීම සඳහා වැඩිදියුණු කළ අනුකූලතා සහ ප්‍රමිති යටිතල ව්‍යූහ සේවා

ලෝක වෙළඳපොළ වලට පිවිසීමට හෝ කලාපීය සමානත්වය සහ ඒකාබද්ධතාවය ලබාගැනිමට සැපයුම් ධාරිතාව වැඩිකර ගැනීම අත්‍යාවශ්‍ය වන නමුත් එය පමණක් ප්‍රමාණවත් නොවේ. අවශ්‍ය නිෂ්පාදන ප්‍රමාණය ලබාගත් පසු ජාත්‍යන්තර සහ කලාපීය වෙළඳපොළ විසින් කිසියම් ප්‍රමිතියක් ඉල්ලා සිටීමේ සහ ජාත්‍යන්තර ප්‍රමිති සහ තාක්ෂණික නියමයන්ය අනුගත වීමේ ගැටළුව මතුවේ. එමෙන්ම, ප්‍රමිති සහ තාක්ෂණික නියමයන්ට අනුකූල වීමට අමතරව පුද්ගලයින්ට හෝ පරිසරයට හානිදායක නොවන තිරසර පිලිවෙත් අනුගමනය කරන බව සනාථ කෙරෙන ක්‍රියාමාර්ගයන්ගේ අවශ්‍යතාවයද දිනෙන් දින වැඩිවෙමින් පවතී. පරිසර කළමණාකරනය සහ සමාජ වගකීම් ක්ෂේත්‍රයන් ජාත්‍යන්තර ප්‍රමිතීන් සහ මග පෙන්වීම් පිළිබඳ දැනුවත්වීමට සහ ඒවා යොදගැනීමට ඔවුන් කටයුතු කළ යුතුය.

ව්‍යාපෘතිය මගින්: :

- ජාතික ප්‍රමිති යටිතල ව්‍යුහයන් සවිමත්කෙරෙන ප්‍රමිති වැඩසටහනක් මගින් කලාපීය සහ බහුපාර්ශවීය වෙළඳ පද්ධතිය හා ඒකාබද්ධවීමට, තාක්ෂණික හැකියාව වර්ධනය කිරීමට සහ ප්‍රමිති, සනීපාරක්ෂක සහ ශාකස්වස්ථතා අවශ්‍යතාවයන්ට අනුකූලවීම වැඩිදියුණු කිරීමට ශ්‍රී ලංකා රජයට සහාය වනුඇත, සහ
- සුළු හා මධ්‍යම ප්‍රමාණයේ ව්‍යාපාරයන් සඳහා ප්‍රමිතිය හා සම්බන්ධ උපදෙස් සේවාවක් සැපයීමට ප්‍රමාණවත් තාක්ෂණික දැනුමක් සහිත දේශීය ප්‍රවීණයින් පුහුණු කිරීමට සහාය දෙනු ලැබේ.

**අපේක්ෂිත ප්‍රතිඵලය 4:** අපනයන පදනම් වූ අංශවල සුළු හා මධ්‍යම ප්‍රමාණයේ ව්‍යාපාරයන්ගේ තරගකාරිත්වය වැඩි කිරීම (කුළුබඩු, ආහාර සහ තොරතුරු තාක්ෂණය/ ව්‍යාපාර ක්‍රියාකාරකම් බැහැර දීමේ කර්මාන්තය-IT/BPO)

විදේශීය වෙළඳපොළ වලට ප්‍රවේශ වීමේදී ශ්‍රී ලංකාවේ සුළු හා මධ්‍යම ප්‍රමාණයේ ව්‍යාපාරයන් අභියෝග ගණනාවකට මුහුණ දෙති. මේ සම්බන්ධයෙන් ව්‍යාපෘතිය තෝරාගත් විසඳුම් ඉදිරිපත් කරයි. දුගීබව තුරන්කිරීමේ අරමුණ ඇතිව ආංශික වශයෙන් යොමුවූ සහ වෙළඳ පොළ තත්වයන්ට ගැලපෙන ප්‍රවේශයක් අනුගමනය කරනු ඇත. මේ සඳහා ප්‍රමුඛත්වය ගන්නා අංශ වන්නේ කුළුබඩු, ආහාර සහ තොරතුරු තාක්ෂණය/ ව්‍යාපාර ක්‍රියාකාරකම් බැහැර දීමේකර්මාන්තය- (IT/BPO) යන අංශයන්ය.

මෙම අංශයන් හා සම්බන්ධ සුළු හා මධ්‍යම ප්‍රමාණයේ ව්‍යාපාරයන් වෙත ලබාදෙන සෘජු සහයෝගය යටතේ:

- වෙළඳපොළ අවශ්‍යතාවයන්ට අනුකූලතාවය දැක්වීම,
- අදාල අංශයන්ගේ සංගම් සවිගැන්වීම,
- සන්නාමයන් සහ අලෙවිය,
- මිලදීගන්නන් සමග ව්‍යාපාර අතර සබඳතා, යන කරුණු ඇතුලත්ය.

# ව්‍යාපෘති හවුල්කරුවෝ

## යුරෝපා සංගමය

**“කලාපීය සහ යුරෝපා සංගමයේ වෙළඳපොළ තුල සුළු හා මධ්‍යම ප්‍රමාණයේ ව්‍යාපාරයන්ගේ වෙළඳ තරඟකාරිත්වය නැංවීම”** නමැති ව්‍යාපෘතිය යුරොපා සංගමය සහ ශ්‍රී ලංකාව අතර වෙළඳාම හා සම්බන්ධ සහයෝගිතා ව්‍යාපෘතියක් ලෙස, යුරෝ මිලියන 8ක අනුග්‍රහයක් මගින් යුරෝපා සංගමය විසින් සම්පූර්ණ මුල්‍යාධාර සපයා ඇත.

මෙම ව්‍යාපෘතිය 2014-2020 ආසියාව සඳහා, එනම්, දකුණු සහ වයඹදිග ආසියාව සඳහා ක්‍රියාත්මක වන යුරෝපා සංගමයේ කලාපීය බහුවාර්ශික දර්ශක වැඩසටහනෙහි කොයසක් ලෙස ක්‍රියාත්මක වේ. එහි අරමුණු වන්නේ දකුණු ආසියානු කලාපීය සහයෝගිතා සංගමය (SAARC) සහ දකුණු ආසියානු නිදහස් වෙළඳ කලාපය (SAFTA) ක්‍රියා මාර්ගයන් සහ යුරොපා සංගමයෙ ජීඑස්පී රාමුව තුල වෙළඳපෙල ප්‍රවේශයන් ලබාගැනීමය.

## ශ්‍රී ලංකා රජය

ව්‍යාපෘතිය ශ්‍රී ලංකාරජය මගින් මෙහෙයවන ව්‍යාපෘතියකි.

ශ්‍රී ලංකා රජය සහ ශ්‍රී ලංකා වානිජ කටයුතු දෙපාර්තමේන්තුව එක්ව ව්‍යාපෘතිය සැලසුම්කර ඇති අතර ක්‍රියාත්මක කරනු ඇත.

ජාතික ප්‍රතිපත්ති සහ ආර්ථික කටයුතු අමාත්‍යාංශය, කර්මාන්ත සහ වානිජ කටයුතු අමාත්‍යාංශය සහ යුරෝපා සංගමයේ ශ්‍රී ලංකා නියෝජිතයින් විසින් සම සභාපතිත්වය දරණ මෙහෙයුම් කමිටුවක් මගින් ව්‍යාපෘතිය මෙහෙයවනු ඇත. ප්‍රවීණ ජාතික මට්මමේ ආයතනයන් සහ ප්‍රමුණ ව්‍යාපාරික ආයතන කාර්ය සැලසුම සකස්කිරීමට සහ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරමට සහාය වනුඇත.

## ජාත්‍යන්තර වෙළඳ මධ්‍යස්ථානය

ජාත්‍යන්තර වෙළඳ මධ්‍යස්ථානය යනු සුළු හා මධ්‍යම ප්‍රමාණයේ ව්‍යාපාරයන් **ජාත්‍යන්තරීකරනය කිරීම සඳහා සහාය දක්වන එක්සත් ජාතීන්ගේ එකම නියෝජිතායතනයයි. සංවර්ධනයවන සහ සංක්‍රාන්තික ආර්ථිකයන් තුල** සුළු හා මධ්‍යම ප්‍රමාණයේ ව්‍යාපාරයන්ට **වඩාත් තරඟකාරී වීමට සහ වෙළඳාම සහ ආයෝජනය සඳහා ජාත්‍යන්තර වෙළඳපොළ හා සම්බන්ධ වීමට** ජාත්‍යන්තර වෙළඳ මධ්‍යස්ථානය ඉඩ සලසයි. එමගින් ආර්ථිකය නංවාලීමට සහ විශේෂයෙන් කාන්තාවන්, තරුණයින් සහ දුගී ප්‍රජාවන්ගේ ආර්ථිකය නංවාලීම සහ රැකියා උත්පාදනය සඳහා ඉඩ ලබාදෙයි.

1964 දී පිහිටුවන ලද ජාත්‍යන්තර වෙළඳ මධ්‍යස්ථානය, එක්සත් ජාතීන්ගේ සහ ලෝක වෙළඳ සංවිධානයේ ඒකාබද්ධ ආයතනයකි.

ව්‍යාපෘතියේ ප්‍රධාන ක්‍රියාත්මක කිරීමේ ආයතනය ජාත්‍යන්තර වෙළඳ මධ්‍යස්ථානයයි.

## එක්සත් ජාතීන්ගේ කාර්මික සංවර්ධන සංවිධානය

එක්සත් ජාතීන්ගේ කාර්මික සංවර්ධන සංවිධානය (UNIDO) යනු දුගීබව අඩුකිරීම, සාර්ව ගෝලීයකරණය සහ පාරිසරික තිරසර භාවය සඳහා කර්මාන්ත සංවර්ධනය ප්‍රවර්ධනය කරන එක්සත් ජාතීන්ගේ විශේෂඥ ආයතනයයි. එක්සත් ජාතීන්ගේ කාර්මික සංවර්ධන සංවිධානයේ දැක්ම වන්නේ සංවර්ධනය වන රටවල සහ සංක්‍රාන්තික ආර්ථිකයන්ගේ සාර්ව සහ තිරසර කාර්මික සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සහ කඩිනම් කිරීමය.

ව්‍යාපෘතියේ කුළුබඩු සහ ආහාර අංශයේ වටිනාකම් දමයන්ගේ ප්‍රමිතිය, සනීපාරක්‍ෂක සහ ශාකස්වස්ථතා අවශයතාවයන් හා අනුකූලතාවය වැඩිදියුණු කිරීමේ සහ ජාතික ප්‍රමිති යටිතල ව්‍යුහයන් සවිමත් කිරීම හා සම්බන්ධ අංශ ක්‍රියාත්මක කිරීමේ වගකීම එක්සත් ජාතීන්ගේ කර්මික සංවර්ධන සංවිධානය දරනු ඇත.

*තමෙ පත්‍රිකාව යුරෝලා සංගමයේ අනුග්‍රහයෙන් සකස්කරන ලදී. මෙහි අඩංගු කරුණු යුරෝපා සංගමයේ අදහස් ප්‍රකාශකිරීම සඳහා කිසිම ආකාරයකින් හෝ යොදු ගත නොහැකිය.*

සොනාලි විජේරත්න මහත්මිය
වානිජ කටයුතු අධ්‍යක්ෂ ජෙනරාල්
වානිජ කටයුතු දෙපාර්තමේන්තුව
දුරකථනය: +94 11 243 0068
ඊමේල්: dgc@doc.gov.lk
බර්මාන්ත හා වානිජ අමාත්‍යාංශය
4 වන මහල, “රක්ෂණ මන්දිරය”,
21 වොක්සෝල් වීදිය, කොළඹ 02,
ශ්‍රී ලංකාව

දයාරත්න සිල්වා මහතා
ජාතික ව්‍යාපෘති සම්බන්ධීකාරක
යුරෝපා සංගමය- ශ්‍රී ලංකා වෙළඳ අනුග්‍රහය
දුරකථනය: +94 11 231 4236
ඊමේල්: dsilva@intracen.org
සතොස ලේකම්කාර්යාල ගෙඩනැගිල්ල,
9 වන මහල,
27 වොක්සෝල් වීදිය, කොළඹ 02,
ශ්‍රී ලංකාව
www.intracen.org

සිල්වි බීටෙප්ස් කොචින් මහත්මිය
වෙළඳ ප්‍රවර්ධන නිලධාරිනී
ආසියා පැසිෆික් කලාප කාර්යාලය
දුරකථනය: +41-22 730 0111
ඊමේල්: betemps@intracen.org
International Trade Centre
Palais des Nations, 1211 Geneva 10,
Switzerland
www.intracen.org